

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2021

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

விமான சேவைகள் மற்றும் ஏற்றுமதி வலயங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு

STATE MINISTRY OF AVIATION AND EXPORT ZONES DEVELOPMENT



වාර්ෂික

කාර්ය සාධන වාර්තාව

2021

වැය ශීර්ෂ අංකය :- 437

ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය

පටුන

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	05
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	27
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක	45
පරිච්ඡේදය 05	-	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	46
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	48
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	50

පෙරවදන

මෙම වාර්තාව 2021 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දක්වා වන කාලය සඳහා එවකට පැවති ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධනය විශ්ලේෂණය සඳහා සකස් කර ඇත.

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් කැබිනට් අමාත්‍යාංශය වන සංචාරක අමාත්‍යාංශය යටතේ 2020 අගෝස්තු 9 වැනි දින අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ප්‍රකාශ කර ඇති අතර 2020 ඔක්තෝබර් 6 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත කර ඇත.

2022 මැයි 27 දිනැති අංක 2281/41 දරණ ගැසට් නිවේදනයට අනුව නව කැබිනට් අමාත්‍යාංශය වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ලෙස පිහිටුවා ඇත.

මෙම නව අමාත්‍යාංශයේ ගුවන් සේවා අංශයේ විෂය පථය යටතේ, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ එහි අනුබද්ධ ආයතන නම්කර ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව 2021 වසර සඳහා ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා සකස් කර ඇති නමුත් වර්තමානයේ ගුවන් සේවා අංශය මෙම අමාත්‍යාංශයට පවරා ඇති බැවින් මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම මාගේ වගකීමක් ලෙස සලකමි.

කේ ඩී එස් රුවන්චන්ද්‍ර

ලේකම්

වරයා නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් 2020 අගෝස්තු 9 වැනි දින අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව පවරා ඇති අතර මෙකී විෂයට අදාළ කැබිනට් අමාත්‍යාංශය වන සංචාරක අමාත්‍යාංශය යටතේ සංචාරක විෂයට සම්බන්ධව 2020 ඔක්තෝබර් 6 දින සිට බලපැවැත්වෙන පරිදි අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කර ඇත. ඒ අනුව විශිෂ්ට ගුවන් සේවාවක් සැපයීම තුළින් සංචාරක කර්මාන්තය ශක්තිමත් කළ යුතුයි. සිවිල් ගුවන්සේවා අධිකාරිය, සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් මාගම හා එහි පාලිත සමාගම් මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට ඇතුළත්කර ඇත. රාජ්‍ය අමාත්‍යාංශය කාර්යයන් අනුව හඳුනාගත් අපනයන සංවර්ධන කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමද මෙම අමාත්‍යාංශයට පැවරී ඇත.

1.2 දැක්ම, මෙහෙවර

1.2.1 දැක්ම

කලාපයේ ප්‍රමුඛතම ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සහ ශ්‍රී ලංකාවේ අපනයන කලාප වඩාත් ආකර්ෂණීය ආයෝජන ස්ථාන බවට පත් කිරීම.

1.2.2 මෙහෙවර

අදාළ ආර්ථික අංශවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ගුවන් ප්‍රවාහන සේවා කාර්යක්ෂම, ආරක්ෂිත සහ පරිශීලක-හිතකාමී සේවාවන් බවට පත් කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා පරිපූර්ණ යටිතල පහසුකම් සහිත සමතුලිත, පරිසර හිතකාමී සහ තාක්ෂණික වශයෙන් දියුණු අපනයන කලාප පද්ධතියක් ස්ථාපිත කිරීමට සහාය වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

නියමිත නීතිවලට අනුකූලව සංචාරක අමාත්‍යාංශයේ උපදෙස් සහ මගපෙන්වීම යටතේ "පරිසර හා දේශීය සංස්කෘතික හිතකාමී, ඉහළ විදේශ විනිමය උපයන සංචාරක කර්මාන්තයක්" සඳහා ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන විෂයට අදාළ ප්‍රතිපත්ති සැකසීමට සහාය වීම. ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන සහ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ පනත්, ආඥාපනත් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අදාළ ආයතනවල විෂයයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම.

1.4 අමාත්‍යාංශයේ විශේෂ ප්‍රමුඛතා

1. පවතින නිදහස් වෙළඳ කලාප සහ කාර්මික නගර ප්‍රශස්ථ මට්ටමේ කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අදාළ යටිතල පහසුකම් කඩිනමින් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම

2. කටුනායක ගුවන් තොටුපලේ දෙවන ධාවන පථය සහ දෙවන මගී පර්යන්තය ඉදිකිරීම

3. කටුනායක ගුවන් තොටුපලේ අභ්‍යන්තර මගී පර්යන්තය සංවර්ධනය කිරීම

4. නුවරඑළිය ගුවන් තොටුපළ ඇතුළු අභ්‍යන්තර ගුවන් තොටුපළවල් සංවර්ධනය කිරීම

5. මත්තල ගුවන් තොටුපලේ වාණිජ මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සහ පහසුකම් වැඩිදියුණු කිරීම

6. ශ්‍රී ලංකන් ගුවන් සේවය ඉහළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සේවා සැපයීමට කටයුතු කිරීම

7. ගුවන් භාණ්ඩ ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීම

1.5 සංවිධාන සටහන

ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ

සංවිධාන සටහන



DD-Deputy Director, **AD**-Assistant Director, **AS**- Assistant Secretary, **AO**-Administrative Officer, **CS**-Coordinating Secretary, **DO**-Development Officer, **MSO**-Management Service Officer, **ITO**-Information Technology Officer, **VG**-Videographer, **SP**-Still Photographer, **AP**-Assistant Photographer, **OES**-Office Employee Assistant

1.6 අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන සහ නෛතික රාමුව

අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ආයතන	ක්‍රියාත්මක කළ යුතු පනත්
1. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 2. සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම 3. සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගම හා එහි පාලිත සමාගම්	1. 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත. 2. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත. 3. 1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත. 4. 2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනත 5. 1950 අංක 15 දරන ගගන යාත්‍රාංගන හා ගුවන් ප්‍රවාහන පනත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්)

	ව්‍යාපෘතියේ නම	විදේශ ආධාර ලබා දෙන ආයතනය	තක්සේරු කල පිරිවැය (Rs.Mn.)	කාලය (මාස)
1	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2, A පැකේජ කාර්යයන් (දෙවන පර්යන්තය සහ අනුබද්ධිත කාර්යයන්)	JICA	105,570	36
2	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2, B පැකේජ කාර්යයන්	JICA	6,118	30
3	සවිස්තරාත්මක සැලසුම් සහ පශ්චාත් සැලසුම් උපදේශන සේවා පියවර II, අදියර 2. C පැකේජ කාර්යයන්	JICA	3,982	130

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි දැක්ම

2.1 ද්විපාර්ශවික හා බහුපාර්ශවික ගුවන් සේවා ගිවිසුම්

- **කෙටි අත්සන් තබන ලද පහත සඳහන් ගුවන් සේවා ගිවිසුම් (ASA) ශ්‍රී ලංකාවේ නම් කරන ලද බලයලත් නියෝජිතයෙකු විසින් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.**
  - ශ්‍රී ලංකාව සහ ඊශ්‍රායලය අතර ගුවන්සේවා ගිවිසුම
  - ශ්‍රී ලංකාව සහ ඇෆ්ගනිස්ථානය අතර ගුවන්සේවා ගිවිසුම

❖ ගුවන් සමාගම් නම් කිරීම

- ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට අමතරව ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර මගී සහ භාණ්ඩ ප්‍රවාහන ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ‘FITS Aviation’සමාගමට අවශ්‍ය පහසුකම් සැපයීම.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව අතර පවත්නා ගුවන්සේවා ගිවිසුමේ විධිවිධාන ප්‍රකාර ව ‘Air Arabia’ සහ ‘Wizz Air Abudabi’ සමාගම් යොදා ගැනීමට කටයුතු කිරීම.

- 2020/21 ශීත සෘතුව සඳහා සතියකට ගුවන් ගමන් 2ක් ක්‍රියාත්මක කිරීමට ‘Azur Airlines’ සමාගමට තාවකාලික අනුමැතියක් (මාස 6ක කාලයක් සඳහා වලංගු) ලබා දීම.

- බංගලිදේශය සහ ශ්‍රී ලංකාව අතර ගුවන් සේවා ගිවිසුම (ASA) හි විධිවිධාන අනුව 'US Bangla Airlines Limited' නම් කිරීමට අමාත්‍යාංශයේ එකඟතාව ලබා දීම.

❖ නව ගුවන් මාර්ග හඳුනා ගැනීම

- ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගුවන් සංචාරක බුබුලක් (Tourism Bubble) නිර්මාණය කිරීම තුලින් දෙරට අතර ගුවන් ගමන් ශක්තිමත් කිරීම .
- කොළඹ-කත්මණ්ඩු ගමනාන්ත අතර සතියකට දෙවරක් ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අවසරය ලබා දීම.
- කොළඹ-කරච්චි,-ලාහෝර්-කරච්චි-කොළඹ ගමනාන්ත අතර සම-අන්තර්ගත අයිතීන් ලබාගැනීම.(මෙය පකිස්තානයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සම්බන්ධීකරණය කරනු ලබයි).

- චීනයේ ෂැංහයි වෙත ශ්‍රී ලන්කන් ගුවන් ගමන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ජා කිරීම.
- ශ්‍රී ලන්කන් ගුවන් සේවය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කොළඹ-ටෙල් අවිව් (ඊශ්‍රායල්) සඳහා ඉල්ලුම් කිරීම සහ ගුවන් ගමන් සඳහා සෞදි ගුවන් අවකාශය හරහා පියාසර කිරීමට සෞදි ගුවන් සේවා බලධාරීන්ගෙන් එකඟතාව ලබා ගැනීම.

❖ ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර සිදුව ඇති ද්විත්ව බදුකරණය (Double taxation) වැළැක්වීමේ ගිවිසුම අවසන් කිරීමට අදාල මූලික කටයුතු සිදු කිරීම.

❖ පස්වන නිදහස් ගුවන් පද්ධතීන් සඳහා (5th Airtrafic Freedom) ද්විපාර්ශවික කණ්ඩායම් සඳහා අනුමැතිය ලබා දීම.

තුර්කි ගුවන් සේවය

- මාලේ හරහා කොළඹ දක්වා ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා පස්වැනි නිදහස් ගුවන් අයිතීන් භාවිතා කිරීමට තුර්කි ගුවන් සේවයට 6 මසකට අවසරය ලබා දීම.

ශ්‍රී ලංකන් ගුවන් සේවය

- කොළඹ - චීනය- මාලදිවයින - කොළඹ අතර .
- කොළඹ - මාලදිවයින -ගැන් දිවයින- කොළඹ
- කොළඹ - මාලදිවයින -සිංගප්පූරුව- මාලදිවයින - කොළඹ
- මාලදිවයින සහ රුසියාව යන ගුවන් මාර්ගයන්හි 5වන නිදහස් ගුවන් අයිතීන් ශ්‍රී ලංකන් ගුවන් සමාගම ක්‍රියාත්මක කිරීම.

❖ පවත්නා ගුවන් සේවා ගිවිසුම් සංශෝධන කිරීම

කැනඩාව සහ ශ්‍රී ලංකාව අතර දැනට පවත්නා ගුවන් සේවා ගිවිසුමේ සංශෝධන කිහිපයක් ඇතුළත් කිරීම සඳහා රාජතාන්ත්‍රික සන්නිවේදන කටයුතු සිදු කිරීම.

❖ සaජු ගුවන් සේවා මෙහෙයුම් ආරම්භ කිරීම.

- ශ්‍රී ලන්කන් ගුවන් සේවය 2021 ජූලි 30 වන දින සිට රුසියාවේ මොස්කව් වෙත සaජු ගුවන් ගමන් නැවත ආරම්භ කරන ලදී.
- හොංකොං, මිලාන්, ෆ්‍රැන්ක්ෆර්ට්, පැරිස්, කත්මන්ඩු ගමනාන්ත සඳහා නව මගී සහ භාණ්ඩ ප්‍රවාහන ගමනාන්ත සහ විශේෂයෙන්ම නයිරෝබි, සිඩ්නි, සෝල් ගමනාන්ත සඳහා ගුවන් භාණ්ඩ ප්‍රවාහන ගමනාන්ත පුළුල් කිරීම.
- ගුවන් ආදායම් වැඩි කිරීම සඳහා නව උපාය මාර්ගයක් ලෙස, කොවිඩ්-19 කාල සීමාව තුළ නව ගුවන් භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් වැඩි කිරීම.



ශ්‍රී ලන්කන් ගුවන් සේවය ඉන්දියාව සමඟ පූර්ව COVID-19 මට්ටමට මෙහෙයුම් ඒකාබද්ධ කිරීම.



දකුණු මාලදිවයිනේ

සංවර්ධනය සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සේවය

Manta ගුවන් සමාගම සමඟ හවුල්ව කටයුතු කිරීම.



පැරිසිය



මිලානෝ



සිඩ්නි



නයිරෝබි

2.2 ජාත්‍යන්තර හා දේශීය ගුවන්තොටුපළ සංවර්ධනය

- ❖ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2, B පැකේජය සියලු සංවර්ධන කාර්යයන් ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශවලට අනුව දුරස්ථ යාත්‍රාංගණය හා ප්‍රවේශ මාර්ග (Remote Apron & Taxiway) සම්පූර්ණ කිරීම.
- ❖ ගුවන් මගීන් සඳහා නව ආගමන කවුළු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ඉදිකර ජනතා අයිතියට පැවරීම.
- ❖ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි නව ගුවන් සංතරණ පද්ධතිය සහ සිවිල් ගුවන් සේවා ආරක්ෂක පද්ධතිය හඳුන්වා දීම.
- ❖ අභ්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම
- ❖ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ අංග සම්පූර්ණ තීරු බදු රහිත අලෙවිසැලක් ස්ථාපිත කිරීම.
- ❖ මත්තල ගුවන් භාණ්ඩ පර්යන්තයේ ගුවන් භාණ්ඩ පරීක්ෂා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම.
- ❖ ජාත්‍යන්තර ගුවන්තොටුපොළක් ලෙස රත්මලාන ගුවන් තොටුපළ නැවත ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.- උදා. මාලදිවයිනට ගුවන් ගමන් ආරම්භ කරන ලදී.
- ❖ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා නව ධාවන පථයක් ඉදිකිරීමට යෝජනා කිරීම

- දේශීය හා විදේශීය සිසුන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් ගුවන්සේවා විශ්ව විද්‍යාලයක තත්ත්වයට ගුවන් සේවා පුහුණු පාසල උසස් කිරීම සඳහා කටයුතු කිරීම.







මගී තදබදය අවම කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ආගමන කවුළු 23ක් මහජනතාව සඳහා දායාද කිරීම



ජාත්‍යන්තර ගුවන්තොටුපොළක් ලෙස රත්මලාන ගුවන් තොටුපළ ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කිරීම සඳහා සංවර්ධන කටයුතු පුළුල් කිරීම





ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා විද්‍යායතනය ලෙස සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය විවෘත කිරීම.

2.3. නිෂ්කාශනය සහ වීසා නිර්දේශ

ගුවන් නියමුවන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය

ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ගුවන් නියමු ප්‍රවේශ අයදුම්පත් ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ඉදිරිපත් කළ යුතු ය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් ලද අයදුම්පත්	ආරක්ෂක අමාත්‍යාංශයට යවන ලද අයදුම්පත්	ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලද අනුමැතිය
167	167	72

❖ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වීසා බලපත්‍ර නිර්දේශ කිරීම් ලිපි

වීසා බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලුම් කරන ලද ගුවන් සේවා විද්‍යායතන සඳහා අමාත්‍යාංශය විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දුන් අයදුම්පත්.

ඇතුල්වීමේ වීසා බලපත්‍ර	103
නේවාසික වීසා බලපත්‍ර	48

❖ ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම - වීසා නිර්දේශ කිරීම්

අනුමැතිය ලබා ගැනීමට සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම ඉල්ලා සිටින වීසා බලපත්‍ර අමාත්‍යාංශය නිර්දේශ කර ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ

	ඇතුල්වීමේ වීසා බලපත්‍ර	නේවාසික/ දීර්ඝ කිරීමේ වීසා බලපත්‍ර
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2. A පැකේජ	427	322
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2. B පැකේජ	08	19
වෙනත්	04	20
එකතුව	**439**	**361**

2.4 ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ -2021

ගරු අමාත්‍යවරයා හරහා කැබිනට් මණ්ඩලයට යොමු කරන අමාතය මණ්ඩල පත්‍රිකා	එකතුව
අමාත්‍ය මණ්ඩල සංදේශ	25
අමාත්‍ය මණ්ඩල සටහන්	3

2.5 වර්තමාන ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය

අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සියලු ප්‍රසම්පාදන කාර්යයන් සඳහා අමාත්‍යාංශ මට්ටමේ කටයුතු කළමනාකරණය/සම්බන්ධීකරණය සිදු කරයි. ඊට අමතරව, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මිලදී ගැනීම් සිදු කිරීමට අවශ්‍ය මහ පෙන්වීම් ද සිදු කරනු ලබයි .

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම - ප්‍රසම්පාදන කටයුතු සහ ප්‍රගතිය

ශ්‍රීලංකන් ගුවන් සමාගම		ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්
ප්‍රදානය කර ඇති	අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු **(CACPA/ CANC)**	04
	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු **(MPC)**	10
ප්‍රදානය සඳහා සූදානම්ව පවතින	අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු **(SCAPC)**	09
	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු **(MPC)**	08
එකතුව	අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු **(SCAPC)**	13
	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු **(MPC)**	18

ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම - ප්‍රසම්පාදන කටයුතු සහ ප්‍රගතිය

ප්‍රසම්පාදන කටයුතු	ප්‍රසම්පාදන ගණන
ප්‍රදානය කර ඇති	**01**
ප්‍රදානය සඳහා සූදානම්ව පවතින	**08**
විවිධ හේතූන් මත ප්‍රමාද වූ	**04**
එකතුව	**13**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2 (BIADP Phase II Stage -2) ප්‍රගතිය

සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය	-	රුපියල් බිලියන 105.5
ඉදිකිරීම් ආරම්භය	-	2020 දෙසැම්බර් 15
ව්‍යාපෘතිය නිමකල යුතු දිනය	-	2023 දෙසැම්බර් 14
ව්‍යාපෘති කාලසීමව	-	අවුරුදු 03
අරමුදල් හවුල්කරු	-	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය
උපදේශක	-	ජපාන ගුවන්තොටුපල උපදේශක සමාගම සහ නිපොන් කොයි සමාගම ආයතනය
කොන්ත්‍රාත්කරු	-	තායිසේ සමාගම, ජපානය

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යය පිළිබඳ දැක්ම' සමඟින් ඉදිරියට යමින් සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙතෙක් පැවති දීර්ග කාලීන ප්‍රමාදයන් හදුනාගෙන **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුප**ළේ **2 වන** පර්යන්ත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය දෙමින් එහි මුල්ගල තැබීමේ උත්සවය 2020 නොවැම්බර් 18 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු අකිරා සුගියාමා මහතා අතින් සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් පසු මගීන්ට වඩාත් හිතකාමී ලෙස ගුවන් තොටුපල මෙහෙයුම් සිදු කිරීමට හැකි වන අතර, නව පර්යන්තය දේශීය සහ විදේශීය සංචාරකයින්ට ප්‍රසන්න සංචාරක අත්දැකීමක් නිර්මාණය කිරීමට හේතු වනු ඇත. නව පර්යන්තය, පරිසර හිතකාමී ගුවන් තොටුපළ මෙන්ම ස්මාර්ට් ගුවන් තොටුපළ යන සංකල්ප මත සංවර්ධනය කෙරේ. මෙහි ඉදිකිරීමට යෝජිත, බහු මහල් රථ ගාල්, නව ගුවන් තොටුපල විවේකාගාර වැනි අමතර පහසුකම්, බහු මාදිලියේ ප්‍රවාහන සේවාවන් ආදී සේවාවන් තුලින් මගීන්ට වඩාත් පහසුවක් ඇති කරනු ලබන අතර එය නව අත්දැකීමක් වනු නොඅනුමානය.

.

EXISTING FACILITIES & PROPOSED FACILITIES OF THE PROJECT (BIADP PII S2)

TYPE	Existing Terminal (T1)	New Terminal (T2) (Package A & B)	TOTAL (After Completion of BIADP PII S2)
Floor Area (m^2)	90,000 m^2	185,900 m^2	275,900 m^2
Check-in Counters	53 nos.	96 nos.	149 nos.
Departure Passport Control Counters	21 nos.	32 nos.	53 nos.
Airside Security Control Positions	8 Positions at Pier No.1 2 Positions at Bus Gate	20 Positions at Pier No.2 and No.3	30 Positions
Contact Gate	8 nos.	16 nos.	24 nos.
Bus Gate	6 nos.	10 nos.	16 nos.
Airline Lounge	4 nos.	6 nos.	10 nos.
Arrival Passport Control Counters	27 nos.	56 nos.	83 nos.
Baggage Claim Carousel	6 nos.	7 nos.	13 nos.
Baggage Make - up Carousel	3 nos.	7 nos.	10 nos.
Aircraft	26 nos.	23 nos. – 28 nos.	49 nos. – 54 nos.
Passenger	6 Million	9 Million	15 Million

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර **II,** අදියර **2** හි ඉදිරි පෙනුම





ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘති සැලසුම්වල ගුවන් ඡායාරූපය





ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදුවන අයුරු

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ පියවර II, අදියර 2 ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම	සංශෝධිත TEC රුපියල් (මිලියන)	වෙන් කිරීම රුපියල් (මිලියන) 2021	2021.12.31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතිය (යෙන් වත්මන් හුවමාරු අනුපාතය අනුව)	2021.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය පියවර II, අදියර 2 පැකේජය A - මගී පර්යන්ත ගොඩනැගිල්ල සහ ආශ්‍රිත වැඩ	105,570	4223	2579	3%	සිවිල් වැඩ - 26.96%, පයිලින් - 68.18%, සබ් ස්ට්‍රක්චර්ස් - 9.02%,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය පියවර II, අදියර අදියර 2 පැකේජය B - දුරස්ථ ගුවන්යානා අංගන සහ ප්‍රවේශ මාර්ග	6,118	878	394	100%	1. දුරස්ථ Apron සහ Taxiway නිමකිරීම 2. රිටෙන්ෂන් පොන්ඩ් 3. ආනයන වර්ග කිරීමේ ගොඩනැගිල්ල 4. සේවා යෝජකයාගේ ව්‍යාපෘති කාර්යාලය 5. තොග ගබඩා
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය පියවර II, අදියර 2 පැකේජය C : සවිස්තරාත්මක සැලසුම් සහ පශ්චාත් සැලසුම් උපදේශන සේවා	3,982	800	502	57%	පැකේජ A සහ B ඉදිකිරීම් අධීක්ෂණය

2.7 අපනයන කලාප සංවර්ධනය

2.7.1 පසුබිම

ලොව දියුණු වෙමින් පවතින රටවල් බොහෝමයක් විසින් විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් අනුව ස්වකීය අපනයන ක්ෂේත්‍රයන් වැඩි දියුණු කිරීම,සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සහ රැකියා උත්පාදනය වැඩි කිරීමේ මාධ්‍යයක් ලෙස අපනයන සැකසුම් කලාප පිටුවහල් කරගෙන ඇත.

අපනයන විවිධාංගීකරණය සහ ප්‍රසාරණය කිරීමේ පුළුල් ප්‍රතිපත්තියහි කොටසක් ලෙස ශ්‍රී ලංකා රජය 1978 දී මහ කොළඹ ආර්ථික කොමිසමේ අධිකාරිත්වය යටතේ කටුනායකදී ප්‍රථම අපනයන සැකසුම් කලාපය පිහිටුවන ලදී. මීට අමතරව, තවත් අපනයන කලාප දෙකක්, එනම් 1986 දී බියගම සහ 1991 දී කොග්ගල ස්ථාපනය කරන ලදී .

විදේශ ආයෝජන අපනයන සැකසුම් කලාප තුල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරන ලද අතර, නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා අවස්ථාව ලබාදෙන ලද අතර ඊට අමතරව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සැලකිය යුතු බදු සහන සහ විධායක මට්ටමේ පුද්ගලයින් සඳහා ප්‍රවේශ වීසා බලපත්‍ර ඔවුන්ට ලබා දෙන ලදී.

කෙසේ වෙතත්, දැනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ අපනයන සැකසුම් කලාප සහ උද්යාන 14 ක් ක්‍රියාත්මක වන අතර බොහෝ කලාප ඒවායේ උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන පසුබිමක් තුළ ආයෝජන මණ්ඩලය 2017 වර්ෂයේදී නව අපනයන කලාප පිහිටුවීම ආරම්භ කර ඇත.

2.7.2 දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

I. බිංගිරිය අපනයන සැකසුම් කලාපය

2017 වසරේ දී දිවයිනේ ප්‍රදේශ කිහිපයක නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ උපාය මාර්ගයට අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිළිවෙළින් අක්කර 164ක් සහ 283ක් පමණ ප්‍රමාණයක් වන ජර්මන්වත්ත" සහ "ගොරොක්ගසාගරවත්ත" නම් වන ඉඩම් දෙකක් යොදාගෙන නව අපනයන සැකසුම් කලාපයක් ස්ථාපිත කර ඇත.

ව්‍යාපෘතිය අදියර කිහිපයකින් ක්‍රියාත්මක කෙරෙන අතර පළමු අදියර ලෙස ජර්මන්වත්ත සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර දෙවන අදියර ලෙස ගොරොක්ගසාගරවත්ත සංවර්ධනය කිරීමට නියමිතය.

අදියර I - ජර්මන් වත්ත

අදියර II - ගොරොක්ගසාගර වත්ත



භූමි ප්‍රමාණය- අක්කර 157



භූමි ප්‍රමාණය- අක්කර 283

දැනටමත් ආයෝජකයින් තිදෙනෙකු බිංගිරිය අපනයන සැකසුම් කලාපය තුල ආයෝජනය කර ඇති අතර සමාගම් තුනෙන් එක් සමාගමක් ඉදිකිරීම් අවසන් කර ඇත . අනෙක් සමාගම් දෙක ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කර ඇති අතර මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.

අපනයන කලාපය බිංගිරිය

දැනට ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ක්‍රියාකාරකම්





සිනර්ජි ෆාමසූටිකල් පුද්ගලික සමාගම



ඉදි වෙමින් පවතින එම්පයර් ෆීඩ් මිල්- බිංගිරිය



සීමාසහිත එම් .එස් . ෂැංහයි ඩොංෂියා ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ස් සීමාසහිත සමාගමට අනුව ඉදි කිරීම්



යටිතල පහසුකම් මාර්ග ඉදිකිරීම් කටයුතු -බිංගිරිය



යටිතල පහසුකම් බෝක්කු ඉදිකිරීම -බිංගිරිය

බිංගිරිය ව්‍යාපෘති වියදම් සහ ප්‍රගතිය - 2021.12.31

රුපියල් මිලියන

වැඩ විස්තරය	ඇස්තමේන්තු ගත පිරිවැය	2021.12.31 දක්වා භාණ්ඩාගාරය මගින් වියදම් කරන ලද අරමුදල්.	2021.12.31 දක්වා ආයෝජන මණ්ඩලය මගින් දරන ලද වියදම	ඉදිරියේදී භාණ්ඩාගාරය මගින් ලබාගැනීමට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය	භෞතික ප්‍රගතිය %
1 කලාපය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම	278.30	278.30			100%
2 මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම	212.00		52.00	160	15%
3 මාර්ග	2,225.27	575.00		1545.40	
තුංතොට සිට ජේ ආර් හංදිය දක්වා	227.10				7.6%
ජේ ආර් හංදියේ සිට වතුවත්ත - හෙට්ටියාකොටුව හංදිය දක්වා	1,998.17				69%
4 ජල සැපයුම	456.28	340.10		00.00	90.0%
හලාවත් ජල සම්පාදන යෝජනා ක්‍රමය					
5 විදුලිබල සැපයුම (ලං. වි .ම)	47.67	12.24	35.43	00.00	
මාදම්පේ ග්‍රිඩ් වැඩපොළ මඟින් මූලික විදුලි බල සැපයුම	12.24	12.24			100%
6 මෙගා වොට් ඇ. 8 ක ස්ථිර විදුලි බල සැපයුම	58.24				
කලාපය ඇතුළත HT Et LT මාර්ග	35.43		35.43		65%
7 ආරක්ෂිත වැට ඉදිකිරීම (පළමු අදියර)					
මුළු වටප්‍රමාණයේ වැට ඉදකිරීම (පළමු අදියර)	32.00		16.50		70%
එකතුව	3,309.76	1,205.64	103.93	1,705.40	

II. වගවත්ත අපනයන සැකසුම් කලාපය

වගවත්ත අපනයන සැකසුම් කලාපය කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති අතර වර්තමානයේදී, මෙම අපනයන සැකසුම් කලාපයේ අක්කර 155 ක භූමි භාගයක් තුල නවතම යුරෝපීය නිෂ්පාදන තාක්ෂණයෙන් සමන්විත දකුණු ආසියාවේ විශාලතම ටයර් කර්මාන්ත

ශාලාව ලෙස සීමාසහිත ෆෙරෙන්ටිනෝ ටයර් කෝපරේෂන් පුද්ගලික සමාගම ක්‍රියාත්මක වෙමින් පවතී.

විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා, වගවන්න අපනයන සැකසුම් කලාපය තුල ජාල උපපොළ (Grid Substation) ඉදිකිරීම වන අතර, අපනයන සැකසුම් කලාපය වෙත ප්‍රවේශ වීම වැඩි දියුණු කිරීම සිදුකරමින් සිටී.



දැනට ඉදි වෙමින් පවතින වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්



සීමාසහිත ෆෙරෙන්ටිනෝ ටයර් කෝපරේෂන් පුද්ගලික සමාගම එහි නිෂ්පාදන





මාර්ග ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය





ජාල උපපොළ ඉදිකිරීම - අවසන් අදියර

වගවත්ත ව්‍යාපෘතියේ වියදම් සහ ප්‍රගතිය-2021.12.31 (රුපියල් මිලියන)

වැඩ විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන	භාණ්ඩාගාර අරමුදල් මගින් යාවත්කාලීන කර ඇත	ආයෝජන මණ්ඩලයේ අරමුදල් මගින් යාවත්කාලීන කර ඇත	භාණ්ඩාගාරය මගින් ලබාගැනීමට අවශ්ය අරමුදල් ප්‍රමාණය	භෞතික ප්‍රගතිය %
1. විදුලි බල සැපයුම (ජාල උපපොළ)	1,898	1697.4		105.32	79.5%
2. මාර්ග	1,282	494.4		787.6	85%
A. වගවත්ත හන්දිය සහ ප්‍රවේශ මාර්ගය (කිලෝමීටර් 2.5)	914				70%
B. අරුණගම පාරේ සිට කලාප සීමාව දක්වා (මීටර් 520)	189				98%
C. අරුණගම පාර (මීටර් 400)	179				98%
3. ආයෝජන මණ්ඩලය මගින් සපයන යටිතල පහසුකම්	230		218		100%
එකතුව	**3,410**	**2192.4**	**218**	**892.92**	

2.7.3 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වීසා බලපත්‍ර නිර්දේශ කිරීම්

කාර්මික කලාප සංවර්ධනය සඳහා පහත දැක්වෙන වීසා බලපත්‍ර වර්ග සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

වීසා නිර්දේශය -:

- ආයෝජකයින්
- කාර්මික ශිල්පීන්
- ඉදිකිරීම් කර්මාන්තයේ නියැලෙන තැනැත්තන්
- වෙනත් වීසා නිර්දේශ කිරීම්

	ප්‍රධාන කාර්යාලය	එකතුව
1	රටට ඇතුල්වීමේ වීසා	2854
2	දීර්ඝ කිරීමේ වීසා/ නේවාසික වීසා	5214
3	තාවකාලික වීසා	649
4	බහු වීසා	3
	එකතුව	**8720**
	අපනයන කලාප වීසා	**එකතුව**
1	රටට ඇතුල්වීමේ වීසා	187
2	දීර්ඝ කිරීමේ වීසා/ නේවාසික වීසා	623
3	තාවකාලික වීසා	52
4	බහු වීසා	4
	එකතුව	**866**

2.7.4 අනාගත ව්‍යාපෘති

2022 අයවැය යෝජනාව යටතේ අපනයන සැකසුම් කලාප 13ක් යෝජනා කර ඇත

අනු අංකය	අපනයන සැකසුම් කලාපය	ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත ආයතනය	ව්‍යාපෘතියේ ස්වභාවය
1.	ආරබොක්ක ඖෂධ නිෂ්පාදන අපනයන කලාපය	ආයෝජන මණ්ඩලය	සංවර්ධන කටයුතු කෙරෙමින් පවතී
2.	එරාවුර් මඩකලපුව රෙදිපිළි නිෂ්පාදන අපනයන කලාපය	ආයෝජන මණ්ඩලය	සංවර්ධන කටයුතු කෙරෙමින් පවතී
3.	ආරබොක්ක හම්බන්තොට කෘෂි සැකසුම් කලාපය	ආයෝජන මණ්ඩලය	නව
4.	මිරිජ්ජවිල හම්බන්තොට වානේ හා බැර කර්මාන්ත කලාපය අදියර II	ආයෝජන මණ්ඩලය	නව
5.	සූරියවැව තොරතුරු තාක්ෂණ කලාපය	ආයෝජන මණ්ඩලය	නව
6.	ගම්පහ හේනේගම විද්‍යුත් හා විදුලි උපකරණ නිෂ්පාදන අපනයන කලාපය	ආයෝජන මණ්ඩලය	නව
7.	බිංගිරිය අදියර II	ආයෝජන මණ්ඩලය	සංවර්ධන කටයුතු කෙරෙමින් පවතී
8.	නුවර තොරතුරු තාක්ෂණ ගම්මානය/ උද්‍යාන (දිගුව)	ආයෝජන මණ්ඩලය	නව
9.	වගවත්ත අපනයන සැකසුම් කලාපය	ආයෝජන මණ්ඩලය	සංවර්ධන කටයුතු කෙරෙමින් පවතී
10.	හම්බන්තොට ග්‍රීඩ් උපපොළ ඉදිකිරීම	ආයෝජන මණ්ඩලය	නව
11.	පුත්තලම ඉස්සන් අපනයන කලාපය	ධීවර අමාත්‍යාංශය	නව
12.	හම්බන්තොට ගල්මුල්ල මත්ස්‍ය අපනයන කලාපය	ධීවර අමාත්‍යාංශය	නව
13.	ඉල්ලුප්පකදාවී මත්ස්‍ය අපනයන කලාපය	ධීවර අමාත්‍යාංශය	නව
14.	මඩකලපුව වාකරෙ කොක්කදිචොරෙ මත්ස්‍ය අපනයන කලාපය	ධීවර අමාත්‍යාංශය	නව
15.	ඇල්පිටිය කෘෂි සැකසුම් කලාපය	කුඩා වැවිලි බෝග වගා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	නව

ලේකම්

වරයා නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශ ලේකම්

ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (වෙනුවට)

පරිච්ඡේදය 03 - 2021 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 කාර්ය සාධන ප්‍රකාශය

ඒ.සී.ඒ -එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	නැවත 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		3,350,052,053	7,548,000,772	
-	ආදායම් බදු	1		-	ඒ.සී.ඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2		-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3		-	
4,000,000,000.00	බදු නොවන ආදායම් හා වෙනත්	4	3,350,052,053	7,548,000,772	
4,000,000,000.00	**මූළු ආදායම් ලැබීම් (අ)**		**3,350,052,053**	**7,548,000,772**	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		914,542,000	168,950,000	ඒ.සී.ඒ -3
-	නැන්පතු		144,340	758,943	ඒ.සී.ඒ -4
-	අත්තිකාරම් ගිණුම්		1,866,456	1,856,025	ඒ.සී.ඒ -5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මූළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**916,552,796**	**171,564,968**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**4,266,604,849**	**7,719,565,740**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-	-	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		**4,266,604,849**	**7,719,565,740**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
58,300,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	38,988,168	23,707,770	
112,664,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	63,815,754	23,947,591	2(ii)
1,500,000.00	සහනාධාර, පුදාන සහ මාරුකිරීම්	7	208,852	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	881,652	
172,464,000.00	**මූළු පුනරාවර්තන වියදම් (ඊ)**		**103,012,774**	**48,537,013**	
	මූලධන වියදම්				
7,500,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,616,821	809,588	
5,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,647,710	628,200	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000.00	හැකියා වර්ධනය	14	303,900	184,500	
1,900,000,000.00	වෙනත් මූලධන වියදම්	15	858,454,164	225,000,000	
1,913,500,000.00	**මූළු මූලධන වියදම් (උ)**		**866,022,595**	**226,622,288**	
	නැන්පතු ගෙවීම්		625,465	240,293	ඒ.සී.ඒ -4
	අත්තිකාරම් ගෙවීම්		3,597,639	4,630,831	ඒ.සී.ඒ -5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**4,223,104**	**4,871,124**	
2,085,964,000.00	**මූළු වියදම් එ = (ඊ+උ+ඌ)**		973,258,471	**280,030,425**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**3,293,346,378**	**7,439,535,315**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**3,293,346,378**	**7,439,535,315**	ඒ.සී.ඒ -7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			-	ඒ.සී.ඒ -3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	16,268,793	1,024,500
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	4,505,988	2,774,806
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**20,774,781**	**3,799,306**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		4,468,462	2,256,156
දේපළ පිරියත හා උපකරණ සංචිතය		16,268,793	1,024,500
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	37,526	518,650
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**20,774,781**	**3,799,306**

පිටු අංක...6.....සිට ..48... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..49.... සිට ...50.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය :	දිනය : 28-01-2022	දිනය : 28.02.2022 .

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
සංචාරක අමාත්‍යාංශය
දෙවන මහල,
ඇසෙට් ආකේඩ් ගොඩනැගිල්ල,
51/2/1, යෝර්ක් වීදිය, කොළඹ 01.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය
30වන මහල, [illegible]

N P Dharmaratne
Chief Accountant
State Ministry of Aviation & Export Zones Development
Level 30, West Tower
[illegible]

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

එසේ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර්ය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2021 රු.	නැවත සලසන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මිළදී ගැනීම්		-	-
ගෙවූ, අධිකාර, අධිමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් බහාවත ලැබීම්		-	-
වෙන් නොකළ ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		1,402,126	221,745
ලැබීම් ලැබීම්		914,542,000	168,950,000
අන්තර්කාරම් ඇසුරෙන් ගැනීම්		2,951,789	5,312,051
තෑගි හා පරිත්‍යාග ලැබීම්		144,340	758,943
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**919,040,254**	**175,242,739**
අඩංගුයි : මුදල් වැය කිරීම්			
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		102,209,757	12,188,029
සහනාධාර සහ මාරුකිරීම්		208,852	-
වෙන් නොවූ ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	(සටහන 01)	(14,000)	120,000
භාණ්ඩාගාරයට සිදුවන ලද ගෙවීම්		-	-
අන්තර්කාරම් ආපසු		3,597,639	6,359,129
පොළී ගෙවීම්		625,465	240,293
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**106,627,712**	**18,907,451**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**812,412,543**	**156,335,288**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ආයෝජන		-	-
ලාභාංශ		-	-
ගිණුමේ ශුද්ධවීමේ ප්‍රතිසාදන හා සංගණනවලින් විනිවිදීම		-	-
උපලේඛ ඇසුරෙන් ගැනීම්		-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
අඩංගුයි : මුදල් වැය කිරීම්			
සංගණන වත්කම් මුදලිකීම් හෙළි කිරීම් සැගීම් හා වෙනත් ආයෝජන ඇසුරෙන් ගැනීම්		812,412,543	156,335,288
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඉ)		**812,412,543**	**156,335,288**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)		**(812,412,543)**	**(156,335,288)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ණය ලබා ගැනීම්		-	-
විදේශීය ණය ලබා ගැනීම්		-	-
ප්‍රතිග්‍රහණ ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඌ)		-	-
අඩංගුයි : මුදල් වැය කිරීම්			
ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3.4 මූල්‍ය වාර්තා ප්‍රකාශය

<u>වාර්තාකිරීමේ පදනම</u>	
1)	<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>
	2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.
2)	<u>මිනුම්කරණ පදනම</u>
	මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
	මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.
3)	<u>ආදායම් හඳුනාගැනීම</u>
	හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.
4)	<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>
	වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ , පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
	දේපළ , පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.
5)	<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>
	මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.
6)	<u>මුදල් හා මුදල් සමාන දෑ</u>
	2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.
7)	<u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස් කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u>
	2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේත විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම්	
		මුල් ඇස්තමේන්තුව	අවසාන ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස
2003.02.08	තොටුපල බදු	19,000,000,000	4,000,000,000	3,350,052,053	83 %

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	172,464,000	172,464,000	103,012,773	60%
ප්‍රාග්ධන	1,913,500,000	1,913,500,000	866,022,595	45%

මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම කේතය	නේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-			
9152	යන්ත්‍රෝපකරණ	16,268,793	16,268,793	Nil	100%
9153	ඉඩම්	-			
9154	අස්පෘශ්‍ය වත්කම	-			
9155	ජීව විද්‍යාත්මක වත්කම.	-			
9160	කෙරීගෙන යන වැඩ	-			
9180	බදුදෙන ලද වත්කම	-			

3.8 විගණකාදීවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඒඒවී/ඒ/එස්එම්ඒර්ඉසෙඩ්/02/21/13 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 මැයි 31 දින

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය CCS,

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසා වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්ති ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1 මූල්‍ය ප්‍රකාශන

1.1මත

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

---

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ය කාර්යාලය
ய்வு அலுவலகம்
UDIT OFFICE

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.3

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

219
AlJDlT 0FFlCE

මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

1.4 ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

319

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5----------

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.5.1----------

ආදායම් ලැබීම්

2020 මැයි 26 දිනැති අංක TOD/REV/M2/01 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ ඡේද අංක 02 ප්‍රකාරව 2021 වර්ෂය තුළ එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳව ඇස්තමේන්තු මුදල් රෙගුලාසි 85(1), (2) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතු කිරීමට අපේක්ෂිත ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මහින් අයකර භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන අපගමන බදු ආදායම් පිළිබඳ ඇස්තමේන්තු සකස් කර නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

1.5.1.1

1.5.1.290053වියදම්

2021 වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ වැඩසටහන් අංක 2 අපනයන කලාප සංවර්ධනය යටතේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 1,900,000,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් එයින් රු.859,000,000 ක් පමණක් වැය කර තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 45 ක් පමණක් වී තිබුණි. තවද මෙම ප්‍රතිපාදනයට අදාල නොවන වියදමක් වූ මඩකලපුව ගුවන් තොටුපලෙහි ධාවන පථය ඉදිකිරීමට අදාල මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවියයුතු හිඟ මුදලක් වූ රු.මිලියන 53.6ක් මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි මෙම වැය ශීර්ෂය යටතේ ගිණුම් ගත කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்

2 මූල්‍ය සම්මාලෝචනය

වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ වැඩසටහන් අංක 01 හි වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කරන ලද

2 , 1 රු.6,000,000 ක ප්‍රතිපාදන සියයට 100ක්ම ඉතිරි කර තිබුණි.

(中) වැඩසටහන් අංක 01 හි තවත් වැය විෂ වර්ෂය තුල ඉතිරි කර තිබූ ප්‍රතිපාදනය සියයට 95 දක්වා වූ පරාසයක පැවතුනි.

田063 සඳහා වූ ප්‍රතිපාදනයන්ගෙන් 319,642 ක් එනම් සියයට 5

Q. L04 55 0

2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වැඩසටහන් වෙනුවෙන් රු. 2,085,964,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර එයින් රු. 1,116,928,632 ක මුදලක් එනම් සියයට 53.5 ක ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබූ අතර කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි වීම, කාර්ය මණ්ඩලය පැමිණීම සීමා වීම, අපේක්ෂිත පරිදි පුරප්පාඩු සපුරාගත නොහැකි වීම, නව ගොඩනැගිලි පරිශ්‍රය වෙත විතැන්වීමේ කටයුතු ප්‍රමාද වීම වැනි කරුණු ඒ සඳහා හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව

2 , 2 කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නීති.රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය

0c.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ) හා (ඇ) ඡේද හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය	අමාත්‍යාංශය විසින් අවම වර්ෂ 03 ක කාලසීමාවක් සඳහා ප්‍රසම්පාදන සැලසුමක් හා එළඹෙන වර්ෂය සඳහා වූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙළ කර නොතිබුණි.

2021 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති ආදායම් ප්‍රමාණය, එකතු කරන ලද ආදායම් ප්‍රමාණය සහ හිඟ ආදායම් කිසිවක් වේ නම් එම ප්‍රමාණය ද පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා ගෙන ගොස් නොනිබූ අතර, තමා වගකීමට බැඳී සිටින විවිධ ආදායම් ශීර්ෂ යටතේ එක් එක් මුදල් වර්ෂයේ ජූනි 30 වෙනි දිනට හා දෙසැම්බර් 31 වන දිනට හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙළ කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොනිබුණි.

!015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ ඡේද අංක 04 (අ) හා මුදල් රෙගුලාසි 128(2)(ඇ)

(qo) 2015

3 ◎ 3000ඒ්චනය

3 , 1කාර්යසාධනය

3.1.1 ක්‍රියාකාරී සැලැස්ම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සියළුම අමාත්‍යාංශ ප්‍රධානීන් විසින් තම ආයතන වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුල නියමිත මුදල් වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් 2020 සහ 2021 වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.2 0 ◦ කරණය

32.1වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ ඃ ◦0◦乙03」27 17 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාක ♂」02(ii)) ඡේදය ප්‍රකාරව විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ ඡේදයට අනුව අමාත්‍යවරයාට වාහන 03ක් ද අමාත්‍ය කාර්ය මණ්ඩලයට වාහන 05 වශයෙන් ලබා දිය හැකි වාහන සංඛ්‍යාව 08 ක් වුවත් එයට පටහැනිව අමාත්‍යාංශය වි අමතර වාහනයක් අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබා දී තිබුණි.

4 යහපාලනය

අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 134(2) වගන්තිය අනුව අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳව ක්‍රමවත් වූද ප්‍රමාණවත් වූද කාර්යක්ෂම වූද පරීක්ෂාවක් කිරීමට හැකි වනු පිණිස අමාත්‍යාංශයේ මුදල් කටයුතු වලට අදාළ අංශයන් සමීක්ෂණයට භාජනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන් සුපරීක්ෂාකාරීව පිළියෙළ කළ යුතු අතර එහිදී විගණකාධිපති විමසා උපදෙස් ලබා ගත යුතු වුවත් අමාත්‍යාංශය 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

සේවා වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	13	6	7
තෘතීක මට්ටම	1	-	1
ද්විතියික මට්ටම	30	20	10
ප්‍රාථමික මට්ටම	13	5	8
තාවකාලික	4	2	2
කොන්ත්‍රාත්	-	2	(2)
එකතුව	61	35	26

2021 35
26
සැසඳීමේ දී පුරප්පාඩු 26 ක් පැවතුනි.

Thenagama.

ටී.ජී.අයි. පද්මිණී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
අපනයන කලාප සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සැපයීම (වගවත්ත)			✓
බිංගිරිය අපනයන කලාප සංවර්ධනය			✓

කාර්ය සාධන දර්ශකය වගවත්ත අපනයන කලාපය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
අත්සන් කල අමාත්‍යාංශ සංදේශ ගණන	✓		
වැඩ නිමකළ මාර්ග පද්ධතියේ ප්‍රමාණය			✓
ලබා දුන් ජාල සැපයුම් ප්‍රමාණය	✓		
සම්පූර්ණ කල ජාල උපපොළ පද්ධති		✓	

කාර්ය සාධන දර්ශකය බිංගිරිය අපනයන කලාපය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
අත්සන් කල අමාත්‍යාංශ සංදේශ ගණන		✓	
වැඩ නිමකළ මාර්ග පද්ධතියේ ප්‍රමාණය			✓
ලබා දුන් ජාල සැපයුම් ප්‍රමාණය		✓	
ලබා දුන් විදුලි සැපයුම් ප්‍රමාණය	✓		

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගත්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වියපෘතියේ නම	ඉලක්කය-අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50% - 74%	75%-100%
අපනයන කලාප සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සැපයීම (වගවත්ත)	9. යටිතල පහසුකම් ගොඩංඅගීම, සියල්ල ඇතුලත් තිරසාර කාර්මීකණය ප්‍රවර්ධනය කිරීම සහ නවයකරණයන් පෝෂණය කිරීම	9.2 සියල්ල ඇතුලත් තිරසාර කාර්මීකණය ප්‍රවර්ධනය කිරීම සහ නවයකරණයන් ප්‍රවර්ධනය කිරීම 2030 වන විට ජාතික තත්වයන්ට අනුකල වන ලෙසට රැකියා සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහල නැංවීම.	9.2.1 දළ දේශීය නිෂ්පාදනයේ හා එක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම 9.2.2		✓	

			රැකියා උත්පාදනය සමස්ත සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය			
බිංගිරිය අපනයන කලාප සංවර්ධනය	9 යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුලත් තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම	9.2 සියල්ල ඇතුලත් තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවයකරණයන් ප්‍රවර්ධනය කිරීම 2030 වන විට ජාතික තත්වයන්ට අනුකූල වන ලෙසට රැකියා සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහල නැංවීම.	9.2.1 දළ දේශීය නිෂ්පාදනයේ හා එක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම 9.2.2 සමස්ත සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය		✓	

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග

ඉලක්ක 09. යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුලත් තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම

මෙහෙවර 9 වන තිරසාර සංවර්ධන ඉලක්කයට සෘජුවම සම්බන්ධ නොවන අතර ඒ අනුව ආයෝජකයන් සහ ව්‍යාපාර ආරම්භකයන් සඳහා යටිතල පහසුකම් සැපයීම අමාත්‍යාංශයේ වගකීමකි.9 වන තිරසාර සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පසුගිය වසරේ අමාත්‍යාංශය ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 මානව සම්පත් කළමනාකරණය- 2021.01.01 සිට 2021.12.31 දක්වා

සේවා මට්ටම්	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	අබෑර්තු
ජ්‍යෙෂ්ඨ	13	06	07
තෘතියික	01	0	01
ද්විතීයික	30	20	10
ප්‍රාථමික	17	07	10
Total	**61**	**33**	**28**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අනුමැතිය මත ද්විතීක හා ප්‍රාථමික අංශයේ නිලධාරීන් කොටසක් මේ වන විටත් බඳවා ගෙන මානව සම්පත් හිඟය මත ඇතිවෙන කාර්යය සාධන බාධාව යම් ප්‍රමාණයකින් තුලනය කර ගැනීමට හැකිවී ඇති අතර 2022 වර්ෂයේදී ඉතිරි තනතුරුද සේවක සැලකිය යුතු සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් මානව සම්පත් හිඟය මත ඇති වී ඇති කාර්ය සාධන බාධාව ඉවත් කර ගැනීමට සැලසුම් කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

(දේශීය හා විදේශීය පුහුණු ඇතුළු වෙනත් වැඩසටහන්- කාල සීමාව 2020.01.01. සිට 2020.12.31 දක්වා)

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව කාන්තා/ පිරිමි	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (Rs.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම /ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
1. වඩා හොඳ කාර්යාල පද්ධතියක් සඳහා පරිගණක, අන්තර්ජාලය සහ පරිගණක ආශ්‍රිත උපාංග සහ මෘදුකාංග ඵලදායී ලෙස	40	දින 1	රු.124000		දේශීය	කාර්ය මණ්ඩල සාමාජිකයින් ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම

භාවිතා කිරීම						
2. රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	2	වසර 1	රු.240000		දේශීය	රටේ සංවර්ධන ක්‍රියාවලියේදී රාජ්‍ය ප්‍රසම්පාදනයේ කාර්යභාරය තේරුම් ගැනීම
3. ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළුව	1	දින 2	රු.7900		දේශීය	ව්‍යාපෘති යෝජනා ලිවීමේ කුසලතා වැඩි දියුණු කර ගැනීම
4. කාර්ය සාධන කළමනාකරණය සහ ප්‍රධාන කාර්ය සාධනය සැකසීම පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය	1	දින 1	රු.2000		දේශීය	කාර්ය සාධන කළමනාකරණ ක්‍රියාවලීන් අවබෝධ කර ගැනීම සහ අදාළ කිරීම, කාර්ය සාධනය පිළිබඳ ඵලදායී සහ නිත්‍ය ප්‍රතිපෝෂණ සැපයීම, කාර්ය සාධනය සහ ඵලදායීතාව වැඩිදියුණු කර ගැනීම

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තා

1.මූල්‍ය ප්‍රකාශන/ගිණුම්

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල / නැත	අදාළ නොවේ නම්, කෙටියෙන්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල විය		
1.2	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල විය		
1.3	වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	නැත		
1.4	අත්තිකාරම් ගිණුම් ගබඩා කරයි	නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල විය		
1.6	වෙනත්			

2. පොත් සහ ලේඛන නඩත්තු කිරීම (FR 445)

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල විය		
2.2	පුද්ගලික වැටුප් කාඩ්පත් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල විය		

2.3	විගණන විමසුම් ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල විය		
2.4	අභ්‍යන්තර විගණන වාර්තාව යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	නැත		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කිරීම සහ නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල විය		
2.6	වෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල විය		
2.7	ඉන්වෙන්ටරි ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල විය		
2.8	කොටස් ලැයිස්තුවක් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල විය		
2.9	අලාභ හා හානි ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූල විය		
2.10	කැපවීම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම			
2.11	කවුන්ටර පොත් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම-(GAN 20)	අනුකූල විය		

3. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් නියෝජනය කිරීම (FR 135)

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
3.1	ආයතනය තුළ මූල්‍ය අධිකාරිය පවරා ඇත	අනුකූල විය		
3.2	ආයතනය තුළ මූල්‍ය අධිකාරියේ නියෝජිත පිරිස දැනුවත් කර ඇත	අනුකූල විය		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකුට හෝ වැඩි ගණනකට බලය පැවරිය හැකි මූල්‍ය බලය පැවරී තිබිය යුතුය	අනුකූල විය		
3.4	2014.05.11 දිනැති රජයේ ගිණුම් චක්‍රලේඛ අංක 171/2004 අනුව රජයේ වැටුප් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනය යටතේ ක්‍රියා කිරීම	අනුකූල විය		

4. වාර්ෂික සැලසුම් සකස් කිරීම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	-		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	-		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර නියමිත දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) ඉදිරිපත් කිරීම	අනුකූල විය		
4.5	දිනයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී	අනුකූල විය		

5. විගණන විමසුම්

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනය අනුව සියලුම විගණන විමසුම්වලට පිළිතුරු දෙන ලදී	අනුකූල විය		

6. අභ්‍යන්තර විගණනය

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
6.1	F.R අනුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. (134) (2) DMA / 1-2019, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව	අනුකූල නො වේ	2021 අවසන් වන තුරුම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණන ශාඛාවක් පිහිටුවා නොතිබුණි	
6.2	මාසයක් ඇතුළත සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම පිළිතුරු දුන්නා			
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.			
6.4	මූල්‍ය රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී			

7.විගණන හා කළමනාකරණ කමිටුව

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
7.1	DMA / 1-2019 අනුව අදාළ වර්ෂය තුළ අවම වශයෙන් විගණන සහ කළමනාකරණ කමිටු 04ක් පවත්වා ඇත.	අනුකූල (2021 දී පවත්වන ලද AMC 02)	වසරකට AMC 04ක් තබා ගැනීමේ අවශ්‍යතාවය DMA ලිපියෙන් 2021 වසර සඳහා නිදහස් කර ඇත. DMA/AMC/M/2021/2 දින 06.09.2021	

8. වත්කම් කළමනාකරණය

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදයට අනුව වත්කම් මිලදී ගැනීම් සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු පාලක ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූල විය		
8.2	ඉහත චක්‍රලේඛයේ 13 පරිච්ඡේදය අනුව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම. සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම නිලධාරියාගේ තොරතුරු පාලක ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබිය යුතුය.	අනුකූල නොවේ		ආකෘතිය පුරවා 2022.05.04 දින පාලක ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යවන ලදී.
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 05/2016 ප්‍රකාර මිනින්දෝරු මණ්ඩලය පවත්වා නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල විය		
8.4	චක්‍රලේඛයේ දක්වා ඇති කාල සීමාව තුළ වාර්ෂික මිනින්දෝරු මණ්ඩලය විසින් අනාවරණය කරන ලද අතිරේක,	අනුකූල විය		

	භාණ්ඩ සහ අනෙකුත් නිර්දේශ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම			
8.5	එෆ්.ආර්. අනුව සේවයට නුසුදුසු භාණ්ඩ බැහැර කිරීම. 772	නැත		

9. වාහන කළමනාකරණය

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
9.1	සංචිත වාහනවල දෛනික ධාවන ප්‍රස්ථාර සහ මාසික සාරාංශ සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.	අනුකූල විය		
9.2	හෙළා දැකීමෙන් පසු මාස 6කට අඩු කාලයක් තුළ හෙළා දකින ලද වාහන බැහැර කර ඇත	අනුකූල විය		
9.3	වාහන ලොග් පොත් නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල විය		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම F.R.103,104,109 සහ 110 ප්‍රකාරව මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇත.	අනුකූල විය		
9.5	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා කර ඇත	අනුකූල විය		
9.6	ආයතනය තුළ වාහන නඩත්තු ලේඛනය පවත්වාගෙන ගොස් තිබුණි	අනුකූල විය		
9.7	ආයතනය තුළ ඉන්ධන ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබුණි	අනුකූල විය		

10. බැංකු ගිණුම් කළමනාකරණය

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/ අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
10.1	නියමිත දිනට බැංකු ප්‍රතිසන්ධාන ප්‍රකාශ සකස් කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී	අනුකූල විය		
10.2	පහත වර්ෂයේ පැවති අක්‍රිය ගිණුම්	නැත		
10.3	බැංකු ප්‍රතිසන්ධාන ප්‍රකාශයන්හි හෙළිදරව් කර සකස් කරන ලද ශේෂයන් සම්බන්ධයෙන් මුල්‍ය රෙගුලාසි ප්‍රකාරව පියවර ගෙන මාසයක කාලයක් තුළ එම ශේෂ පියවා ඇත.	අනුකූල විය		

11. අරමුදල් භාවිතය

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
11.1	වෙන් කළ ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබුණි	අනුකූල විය		
11.2	F.R අනුව සපයා ඇති ප්‍රතිපාදන භාවිතා කිරීමෙන් පසු වසර අවසානයේ වගකීම් කරා ළඟා වීම. 94 (1) ප්‍රතිපාදන සීමාව නොඉක්මවන	අනුකූල විය		

12. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල විය		
12.2	හිඟ ණය ශේෂයන් පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරන ලදී	අනුකූල විය		
12.3	වසරකට වැඩි කාලයක් සඳහා ඉතිරිව ඇති හිඟ ණය ශේෂය පියවා ඇත	අනුකූල විය		

13. සාමාන්‍ය තැන්පතු ගිණුම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අදාළ / අදාළ නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිවැරදි තීරණ උපාය මාර්ග
13.1	F.R.571 අනුව කල් ඉකුත් වූ තැන්පතු සඳහා පියවර ගෙන ඇත	අනුකූල විය		
13.2	සාමාන්‍ය තැන්පතු සඳහා පාලන ගිණුම් යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අනුකූල විය		

14. අග්‍රිම ගිණුම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අදාළ / අදාළ නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිවැරදි තීරණ උපාය මාර්ග
14	14. අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී	අනුකූල විය		
14.2	F.R ට අනුව එය අවසන් වූ වහාම මාසයක් ඇතුළත Ad-hoc sub imprests නිරවුල් කර ඇත. 371	අනුකූල විය		
14.3	F.R අනුව අනුමත සීමාව ඉක්මවා Ad-hoc sub imprests නිකුත් කර නොමැත. 371	අනුකූල විය		
14.4	භාණ්ඩාගාර පොත් සමඟ මාසික ගිණුම් ශේෂය ප්‍රතිසන්ධානය කිරීම	අනුකූල විය		

15. ආදායම් ගිණුම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
15.1	රෙගුලාසිවලට අනුව ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කර ඇත	අනුකූල විය		

15.2	බැර කරන ලද තැන්පතු තැන්පතු ගිණුම්වල තැන්පත් නොකර තැන්පතු ගිණුමට කෙලින්ම එකතු කරනු ලැබේ	අනුකූල විය		
15.3	F.R.176 අනුව ශේෂ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී	අනුකූල විය		

16. මානව සම්පත් කළමනාකරණය

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සේවක සංඛ්‍යා සීමාව තුළ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවා තිබුණි	අනුකූල විය		
16.2	සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ලිඛිතව රාජකාරි ලැයිස්තු ලබා දී ඇත	අනුකූල විය		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 MSD චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.			

17. මහජනතාවට තොරතුරු සැපයීම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
17.1	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සහ රෙගුලාසිවලට අනුකූලව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සහ තොරතුරු ලේඛනයක් යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අනුකූල විය		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා සපයනු ලබන අතර වෙබ් අඩවිය හෝ විකල්ප මාර්ග හරහා සංවිධානය පිළිබඳ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට මහජනතාවට පහසුකම් සලසා තිබිය යුතුය	-		කැබිනට් අමාත්‍යාංශ වෙබ් අඩවිය හරහා විස්තර සපයන අතර මේ වන විට අමාත්‍යංශයේ අපේම වෙබ් අඩවියක් සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත
17.3	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 08 සහ 10 වගන්තිවලට අනුව වසරකට දෙවරක් හෝ වරක් වාර්තා ඉදිරිපත් කර ඇත.	-		2022 වසරේ සිට ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත

18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
18.1	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2018 (1) දරන කළමනාකරණ වක්‍රලේඛයට අනුව	අනුකූල විය		

	පුරවැසි/සේවාදායක ප්‍රඥප්තියක් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.			
18.2	පුරවැසි / සේවාලාභියාගේ ප්‍රඥප්තිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කරන ලදී.	අනුකූල විය		.

19. මානව සම්පත් සැලැස්ම සකස් කිරීම

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 මත පදනම්ව මානව සම්පත් සැලැස්මක් සකස් කරන ලදී - ඇමුණුම 02	අනුකූල නොවේ		නව අමාත්‍යාංශයක් බැවින් අපේක්ෂිත මානව සම්පත් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ආරම්භක කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීය. අමාත්‍යාංශයේ විෂය පථය කිහිප වතාවක් වෙනස් වූ බැවින් තවමත් සැලැස්ම සකස් කරමින් පවතී
19.2	ඉහත මානව සම්පත් සැලැස්මේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වසරකට පැය 12 කට නොඅඩු පුහුණුවක් සහතික කෙරේ	අනුකූල විය		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දක්වා ඇති ආකෘතිය මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කරන ලදී.	අනුකූල විය		

19.4	ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර, ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය අනුව (19.1 හි සඳහන්) මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා වර්ධන වැඩසටහන් සංවර්ධනය, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම් පවරන ලදී.	අනුකූල විය		

20. විගණන පරාස වලට ප්‍රතිචාර දක්වන්න

අංකය	අදාළ අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල/අනුකූල නොවේ	අදාළ නොවේ නම්, කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග යෝජිතය
20.1	පසුගිය වසර සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන ඡේදවල පෙන්වා දී තිබූ අඩුපාඩුව නිවැරදි කර ඇත.	අනුකූල විය		